FACULTY OF MEDICINE
UNIVERSITY OF RUHUNA
GALLE
18 AUG 2022
DEAN'S OFFICE

5

LMS
Noti Bd.

කාර්යාලය / காரியாலயம் / Office 047 2222247
ෆැක්ස් / பெக்ஸ் / Fax 047 2222247
E mail-jayaruwanm@gmail.com

# ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන
# பாலுறவுநோய்/எய்ட்ஸ் தடுப்பு வேலைத்திட்டம்
# STD/AIDS CONTROL PROGRAMME

ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන් කාර්යාලය
பாலுறவுநோய்/எய்ட்ஸ் தடுப்பு வேலைத்திட்ட காரியாலயம்

මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No
දිනය / திகதி / Date 0

**District unit**
**General Hospital -Hambanthota**

NATIONAL STD/AIDS CONTROL PROGRAMME

මගේ අංකය : H/STD/DO/ WAD

දිනය:2022.07.19.

පීඨාධිපති,
වෛද්‍ය පීඨය,
කරාපිටිය,
ගාල්ල.

<u>"එක්වෙමු පරදමු HIV" දකුණු පළාත් මුහුණු පොත් දැන්වීම් (Facebook Post) තරඟය.</u>

ශ්‍රී ලංකාවේ දැනට පවතින ආර්ථික හා සමාජීය අරබුද හමුවේ HIV/AIDS පිළිබඳ ප්‍රජාව එක්රැස් කර දැනුවත් කිරීමට නොහැකි වීමේ ගැටළුවට විසඳුමක් ලෙස ජාතික ලිංගාශ්‍රිත රෝග මර්ධන වැඩසටහනේ සහ හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මගපෙන්වීම පරිදි "එක්වෙමු පරදමු HIV" තේමාව කර ගනිමින් සමාජ මාධ්‍ය භාවිතයට වැඩි නැඹුරුවක් ඇති තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ඔවුන් තුළ HIV/AIDS වැලැක්වීමේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් HIV/AIDS පිළිබඳ මුහුණු පොත් දැන්වීම් (Facebook Post) තරඟයක් පැවැත්වීමට හම්බන්තොට දිස්ත්‍රික් ලිංගාශ්‍රිත රෝග මර්ධන ඒකකය කටයුතු යොදා ඇත.

<u>තරග කොන්දේසි</u>

- HIV/AIDS ව්‍යාප්තිය වැලැක්වීමට දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය, HIV පරීක්ෂාවන් සහ ප්‍රතිකාර සඳහා යොමු වීම ප්‍රවර්ධනය හෝ HIV/AIDS රෝගීන්ට වෙන්කොට හා කොන්කිරීමෙන් තොරව සැලකීමට අදාළ දැන්වීමක් විය යුතුය.
- වයස අවු: 14 ට වැඩි දකුණු පළාත තුළ ස්ථිර පදිංචි ඕනෑම පුද්ගලයකුට ආයතනයකට හෝ කණ්ඩායමකට අයදුම්කල හැක.
- අවම වශයෙන් Jpeg හෝ png ආකෘති අනුව පික්සල් 1200x630 වත් ප්‍රමිතියකින් යුක්ත විය යුතුය.
- සිංහල ඉංග්‍රීසි හෝ දමිළ යන ඕනෑම භාෂාවක් භාවිතා කළ හැකිය.
- හම්බන්තොට ලිංගාශ්‍රිත රෝග මර්ධන සායනයේ නම, ලාංඡනය, දුරකතන අංකය සහ ජාතික HIV/AIDS හා ලිංගාශ්‍රිත රෝග මර්ධන ව්‍යාපාරයේ ලාංඡනය දැන්වීමේ අඩංගු විය යුතුය.
(අයදුම් කරුවන්ට අදාල ලාංඡන අප විසින් එවනු ලැබේ.)
- දැන්වීම ස්ව නිර්මාණයක් විය යුතු අතර අනුකරණ ඉදිරිපත් කළ නොහැක.

- කිසියම් පුද්ගලයකුට ආයතනයකට හෝ කිසිදු ආගමකට ජාතියකට අගතියක් සිදුවන කිසිවක් අඩංගු නොවිය යුතු අතර කිසිදු වාණිජ හෝ දේශපාලන පණිවුඩයක් අඩංගු නොවිය යුතුය.

<u>ජයග්‍රාහකයන් තේරීම</u>

- ජයග්‍රාහකයන් තේරීමේදී මුහුණු පොතේ වැඩිම ලඟාවීම් (reach) ලබා ඇති නිර්මාණ 10 තෝරා ඒ අතරින් අවසන් ජයග්‍රහකයන් තෝරා ගැනීම නිර්මාණ වල ගුණාත්මක භාවය හා අන්තර්ගතය අනුව තාක්ෂණික කමිටුවක් මගින් ලබාදෙන ලකුණු ප්‍රමාණය අනුව තීරණය වේ.

- එක් අයකුට ආයතනයකට හෝ කණ්ඩායමකට නිර්මාණ 3 ක් ඉදිරිපත් කළ හැකි නමුත් වැඩිම ලකුණු ලබා ඇති එක් දැන්වීමක් පමණක් ජයග්‍රහණය සඳහා තෝරා ගැනේ.

- තාක්ෂණික කමිටුවක් මගින් දැන්වීමේ ප්‍රමිතිය සහ අන්තර්ගතයේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව එවනු ලබන අනුපිළිවෙල අනුව අදාල දැන්වීම් හම්බන්තොට ලිංගාශ්‍රිත රෝග මර්ධන සායනයේ Facebook පිටුවට උඩුගත (upload) කරනු ලැබේ.

- දැන්වීම 2022 සැප්තැම්බර් 15 සිට නොවැම්බර් 15 දක්වා ප්‍රචාරණය කරනු ලබන අතර ළඟාවීම් ගණන (reach) වැඩිකර ගැනීම තරඟකරුවන්ගේ වගකීම වේ.

<u>අයදුම් කිරීම.</u>

- මෙහි සඳහන් කර ඇති ගූගල් සබැඳිය මගින්, සාමාන්‍ය තැපැල මගින් හෝ පහත විද්‍යුත් තැපැල මගින් 2022-08-15 දිනට ප්‍රථම එවිය යුතුය.
  ගූගල් සබැඳිය (Google Link) https://forms.gle/EUY8PssB3DHHZ5wb9
  විද්‍යුත් තැපැල (Email) stdclinic.hambantota@gmail.com
  සාමාන්‍ය තැපැල - ලිංගාශ්‍රිත රෝග මර්ධන සායනය, පැරණි රෝහල් පරිශ්‍රය, හම්බන්තොට.

- සියලු නිර්මාණ 2022.09.15 දිනට ප්‍රථම පහත සඳහන් අපගේ විද්‍යුත් තැපැල වෙත යොමුකළ යුතුය. stdclinic.hambantota@gmail.com

<u>ත්‍යාග</u>

- ප්‍රථම ස්ථානය - රු 20,000.00 ක මුදල් ත්‍යාගයක් සහ සහතික පත්‍රයක්
- දෙවන ස්ථානය - රු 15,000.00 ක මුදල් ත්‍යාගයක් සහ සහතික පත්‍රයක්
- තෙවන ස්ථානය - රු 10,000.00 ක මුදල් ත්‍යාගයක් සහ සහතික පත්‍රයක්
- සහ රු. 2,000.00 ක සැනසිලි මුදල් ත්‍යාග 5 ක් පිරිනමනු ලැබේ.

වැඩිදුර තොරතුරු සඳහා විමසීම්- 0472222247 ලක්මාල්/ප්‍රසාදිනී
0714557333 ලක්මාල්
stdclinic.hambantota@gmail.com

ඔබ ආයතනයේ සේවක මහත්ම මහත්මීන් සහ ප්‍රජාව දැනුවත්කොට උක්ත තරගයට සහභාගී කරවීම සඳහා අවශ්‍ය සහයෝගය දක්වන මෙන්ද මේ සමග එවා ඇති පෝස්ටරය ඔබගේ ආයතනයේ ප්‍රදර්ශනය කරන මෙන්ද කාරුණිකව ඉල්ලා සිටිමි.

ආයතන භාර වෛද්‍ය නිළධාරි

DR. L.K.H.M. Jayaruwan
MO-IC
National STD.HIV/AIDS
Control Programme
Hambantota

පිටපත්-

01.අධ්‍යක්ෂ ජාතික ලිංගාශ්‍රිත රෝග මැඩපැවැත්වීමේ - දැ.ගැ.ස.
02.පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - දැ.ගැ.ස

“එක්වෙමු පරදමු HIV”

HIV/AIDS පිළිබඳව දීපව්‍යාප්ත මුහුණු පොත් දැන්වීම් (Facebook Post) තරඟාවලිය

<u>අයදුම්පත්‍රය</u>

| | |
|---|---|
| සම්පූර්ණ නම/ ආයතනයේ නම | |
| ලිපිනය | |
| පදිංචි දිස්ත්‍රික්කය | |
| උපන්දිනය | |
| වයස | |
| ජා.හැ අංකය | |
| ඉහළම අධ්‍යාපන සුදුසුකම | |
| රැකියාව/ පාසල | |
| නිර්මාණ ගණන | |
| දුරකථන අංකය | |
| විද්‍යුත් තැපැල | |

මා/ අප ආයතනය ඉදිරිපත් කරන නිර්මාණය කිසියම් පුද්ගලයකුට ආයතනයකට හෝ කිසිදු ආගමකට ජාතියකට අගතියක් සිදුවන කිසිවක් අඩංගු කර නොමැති අතර මෙය ස්ව නිර්මාණයක් බවත් අනුකරණයක් නොවන බවත් සනාථ කරමි.
තවද මෙම තරගය සඳහා අදාළ තරග කොන්දේසි කියවා එම සියලු කොන්දේසි වලට එකග වන අතර යම් කොන්දේසියක් කඩකළහොත් මා නුසුදුස්සකු වන බව ද පිළිගනිමි.

දිනය .................

..................................
අයදුම්කරුගේ අත්සන

* අයදුම්පත් සාමාන්‍ය තැපැල මගින් ලිංගාශ්‍රිත රෝග මර්ධන සායනය, පැරණි රෝහල් පරිශ්‍රය, හම්බන්තොට යන ලිපිනයට හෝ stdclinichambantota@gmail.com විද්‍යුත් තැපැල මගින් 2022-08-15 දිනට ප්‍රථම එවිය යුතුය.

# ලිංගාශ්‍රිත රෝග මර්ධන ඒකකය - හම්බන්තොට

# "එක්වෙමු පරදමු HIV"

# මුහුණු පොත් දැන්වීම් (Facebook Post) තරඟය

# HIV AIDS

වයස අවුරුදු 14 ට වැඩි දකුණු පළාතේ පදිංචි ඕනෑම පුද්ගලයකුට හෝ ආයතනයකට සිංහල, ඉංග්‍රීසි හෝ දමිළ යන ඕනෑම භාෂාවක් භාවිතා කරමින් දැන්වීම් 3 ක් හෝ ඊට අඩු ප්‍රමාණයක් තරඟය සඳහා ඉදිරිපත් කළ හැක

ත්‍යාග

ප්‍රථම ස්ථානය - රු 20,000.00

දෙවන ස්ථානය - රු 15,000.00

තෙවන ස්ථානය - රු 10,000.00

සහ රු. 2,000.00 සැනසිලි ත්‍යාග 5 ක්

අයදුම් පත්‍ර 2022.08.15 දිනට පෙර https://forms.gle/EUY8PssB3DHHZ5wb9 ගූගල් සබැඳිය මගින් ලිංගාශ්‍රිත රෝග මර්ධන ඒකකය, පැරණි රෝහල, හම්බන්තොට ලිපිනයට හෝ stdclinichambantota@gmail.com යන ලිපිනයට ඊ මේල් කරන්න

වැඩි විස්තර සඳහා ලක්මාල් - 047 2222247
071 4557333

National STD/AIDS Control Programme - Hambantota Unit